**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතියේ- 02 ව්‍යාපෘතිය (අඹතලේ බලශක්ති සුරැකුම් ව්‍යාපෘතිය) – 2017**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන ව්‍යාපෘතියේ - 2 ව්‍යාපෘතියේ (අඹතලේ බලශක්ති සුරැකුම් ව්‍යාපෘතිය) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ඒජන්ස් ප්‍රන්කයිස් ඩිවෙලොප්මන්ට් (Agence Francaise Development) අතර 2014 සැප්තැම්බර් 29 දින එළඹි අංක සීඑල්කේ 1008-01 පී දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.2 (එච්) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් ප්‍රවේශය පුළුල් කිරීම හා ජල පද්ධතියේ තිරසර පෝෂණය ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 13,000 කට සමාන එ.ජ.ඩො.මිලියන 100 ක් වූ අතර ඉන් සියයට 70 ක් එනම්, රු.මිලියන 9,100 කට සමාන එ.ජ.ඩො.මිලියන 70 ක් ඒජන්ස් ප්‍රන්කයිස් ඩිවෙලොප්මන්ට් (Agence Francaise Development) මගින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන සියයට 30 එනම්, රු.මිලියන 3,900 කට සමාන එජඩො මිලියන 30 ක් ශ්‍රී ලංකා රජයේ දායකයෙන් අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 29 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා

ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා  පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘතියේ කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරුවනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල  දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ගයන් ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මාගේ ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ගයන් ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අඹතලේ සිට එලි හවුස් ජලාශය දක්වා කිලෝමීටර් 09 ක මෘදු යකඩ බට සපයා එලීමේ කාර්යයන්වල නියුතු කොන්ත්‍රාත්කරුට 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ රු. මිලියන 22.88 ක මුදල ගිණුම්වලට ගෙන නොතිබුණි. තවද, ඉහත සඳහන් කොන්ත්‍රාත්තුවේ කරන ලද වැඩවල වටිනාකම වූ රු.මිලියන 1.04 දෙවරක් ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස පෙන්වා ඇති රු.මිලියන 184.08 ක අගය රු.මිලියන 21.84 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අගය මත එකතු කල සමුච්චිත බදු වූ රු.මිලියන 73.46 මුදල කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට ශ්‍රී ලංකා රජයේ දායකත්වය ලෙස ලද මුදලට එරෙහිව ගෙවා හිලව් කර තිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

රජයේ මිලදී ගැනීම් මහ පෙන්වීම්හි 8.9.3 පරිච්ඡේදයට අනුව, වටිනාකම රු.මිලියන 500 ක් හෝ ඊට වැඩි කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වන විධිමත් ගිවිසුම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අත්සන් කල යුතුය. කෙසේ වුවද, ගොතටුව ජලාශය ඉදිකිරීම, ගොතටුව විදුත් (Booster) පොම්පාගාරය, අඹතලේ සිට එලි හවුස් දක්වා කිලෝමීටර් 09 ක මෘදු ජලනල සැපයීම හා එලීම හා උපදේශක සේවා ආදිය සඳහා වන විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් අත්සන් කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය , සමාලෝචිත වර්ෂය තුල හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය පහසුකම් ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ඒඑෆ්ඩී | 70 | 9,100 | 111.1 | - | - | 5.00 | 695.17 |
| ශ්‍රීලංර | 30 | 3,900 | 34.4 | 0.22 | 34.39 | 0.64 | 89.92 |
| එකතුව | 100 | 13,000 | 145.5 | 0.22 | 34.39 | 5.64 | 785.09 |

ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී වසර 03 ක් ගතවී තිබුණද, ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදනය වූ රු.මිලියන 9100 කට සමාන ඇ.එ.ජ.ඩොලර් මිලියන 70 ක මුදලින් රු.මිලියන 695.17 කට සමාන ඇ.එ.ජ.ඩොලර් මිලියන 5.00 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට භාවිතා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කාර්යයන් සම්පූර්ණ කිරීමට හැකිවන පරිදි පුළුල් සැලැස්මක් පිළියෙල කර ව්‍යාපෘතියේ නියමිත කාලපරිච්ඡේදය තුල අරමුදල් ප්‍රතිපාදන භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. අරමුදල් භාවිතය මන්දගාමීවීම නිසා ණය දෙනු ලබන නියෝජිතායතනය වගකීම් ගාස්තු ලෙස රු.මිලියන 146.80 කට සමාන ඇ.එ.ජ.ඩොලර් මිලියන 1.04 මුදලක් අයකරගෙන තිබූ බව නිරීක්ෂණය විය.

**3.2 භෞතික ප්‍රගතිය**

ලද තොරතුරු අනුව, අඹතලේ සිට එලි හවුස් ජලාශය දක්වා කිලෝමීටර් 9 ක් මෘදු යකඩ ජලනළ සැපයීමේ හා එලීම සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 84.76 ක් වුවද, එදිනට සියයට 18.72 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්වා තිබුණි. තවද, ව්‍යාපෘතියේ

කාර්යයන් 2014 සැප්තැම්බර් 29 ආරම්භ කලද, පිරිසිදු කිරීමේ පිරියත හා මුළුමහ නව පොම්ප ස්ථානගත කිරීම හා ප්‍රතිසංස්කරණය, අධීක්ෂණ පාලන හා දත්ත පවරා ගැනීමේ පද්ධතිය ස්ථාපිත කිරීම, අඹතලේ පාලන ගොඩනැගිල්ල හා බැක්වොෂ් රිකවරි පද්ධතිය ඉදිකිරීම, සහ ගොතටුව සිට කොළඹ නගරය දක්වා කිලෝමීටර් 05 මෘදු යකඩ ජලනළ සැපයීමේ හා එලීම යනාදී අනෙකුත් සිවිල් ඉදිකිරීම් සඳහාවන කොන්ත්‍රාත් 2017 දෙසැම්බර් 31 වන විටත් ප්‍රදානය කර නොතිබුණි. ලද තොරතුරු අනුව, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම පමාවීම හා කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම මන්දගාමී ප්‍රගතියට හේතු වී තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජලාශය, ජල ටැංකිය හා කාර්යාල ගොඩනැගිල්ල ගොතටුව ජලය පිරිසිදු කිරීමේ පිරියත භූගත ජලාශය ඉදිකිරීමේ ඉඩමේ හිමිකම, 2017 මාර්තු 31 දින වන විටත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා නොතිබුණි.

(ආ) මිලිමීටර් 1200 මෘදු යකඩ ජලනළ සැපයීම හා එලීම සමඟ ගොතටුව ජලාශය හා විදුහුත් බලැති පොම්පාගාරය (Booster Pump station) ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත් ව්‍යාපෘතියේ ප්‍රමුඛතා මිලදී ගැනීම් ලෙස හඳුනාගෙන 2015 අප්‍රේල් 21 දින ලංසු සඳහා ආරාධනා කර තිබූ අතර, අදාල කාර්යයන් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් දින 990 ක පමාවීමක් සහිතව 2018 ජනවාරි 04 දින ඇතුළත් වි තිබුණි. තවද, 2018 මාර්තු 31 දින වන විටත් කොන්ත්‍රාත්කරු වැඩබිම පරික්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අඹතලේ සිට එලි හවුස් ජලාශය දක්වා කිලෝමීටර් 9 ක ප්‍රමාණය මෘදු යකඩ ජලනළ හා උපාංග සපයා එලීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2015 ජුලි 01 දින ආරම්භ කර 2018 මැයි 04 දින වන විට අවසන් කල යුතුව තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල මූල්‍ය තත්ත්වය හා ද්‍රව්‍ය හා උපාංග සැපයීමේ පමාව නිසා ජලනළ එලීමේ කාර්යයන් කොන්ත්‍රාත්තුවේ මාස 22 ක කාලයෙන් මාස 19 ක් ගතවීමෙන් පසු 2018 ජනවාරි 30 දින ආරම්භ කර තිබුණි

(ඇ) ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ අඹතලේ ජලය පිරිසිදු කිරීමේ පිරියතේ බලශක්ති පරිභෝජනය අවම කිරීම වුවද, බලශක්ති පරිභෝජනයට සෘජුවම අදාලවන පිරිසිදු කිරීමේ පිරියතේ නව පොම්ප ස්ථාපිත කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම හා අධීක්ෂණ පාලන දත්ත පවරා ගැනීමේ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා වන කොන්ත්‍රාත් 2018 මාර්තු 31 වන දින වන විට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී මාස 42 ක් ගතවීමෙන් පසුව වුවද, ප්‍රදානය කිරීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය කටයුතු කර නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතියේ ආරම්භක අවස්ථාවේදී, ඉදිකිරීම් කාර්යයන් හා මිලදී ගැනීම් සඳහා යෝග්‍ය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබූ අවස්ථා කිහිපයක් නිරීක්ෂණය වූ අතර මේ නිසා මිල වෙනස්වීම් සමඟ අතිරේක පිරිවැයක් දැරීමට සිදුවීමේ හැකියාව විගණනයට බැහැර කිරීමට නොහැකි විය. කිලෝමීටර් 09 ක් වූ මෘදු යකඩ ජලනළ සපයා එලීම සඳහා වන කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු ඇස්තමේන්තුවේ අගල්වල ගැඹුර මීටර් 2.5 මීටර් 3.00 දක්වා පරාසයක මීටර් 500 දුර ජලනළ එලීම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු මීටර් 1,587 ක් දුරට වැඩි වී තිබුණි. තවද, අගල් ගැඹුර 03 කට වැඩි ජලනළ එලීමේ දුර මීටර් 985.20 ක් ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඇතුළත් කර ඇස්තමේන්තුගත කර නොතිබුණි. මෙය කොන්ත්‍රාත්කරුට නව රේටයන් භාවිතා කිරීමට ඉඩ සලසා තිබුණි.

**3.4 අරමුදල් ඌණ උපයෝජනය**

-----------------------------------------

විශේෂ ඩොලර් ගිණුමෙන් 2016 මාර්තු 30 දක්වා පුනරාවර්තන වියදම් දැරීම සඳහා රු.මිලියන 05 ක් ව්‍යාපෘතියේ දෙවන පරම්පරාවේ බැංකු ගිණුමට මාරුකර තිබූ අතර, ඉන් රු.මිලියන 1.95 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට වියදම් නොකර ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය.

**3.5 මතභේදයට තුඩුදෙන කරුණු**

---------------------------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කල ප්‍රගති වාර්තා අනුව, අඹතලේ මුළුමග සහ පිරිසිදු කිරීමේ පිරියත අළුතෙන් යෙදීම හා ප්‍රතිසංස්කරණය සඳහා වන කාර්යයන් 2020 මැයි මස අවසන් කිරීම කළ යුතුව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කළ යුතු දිනය වන 2019 දෙසැම්බර් 31 දිනය නොසලකා මෙම වැඩ අවසන් කිරීම් දිනය තීරණය කර තිබුණි.

(ආ) අඹතලේ සිට එලි හවුස් ජලාශය දක්වා මෘදු යකඩ ජලනළ සැපයීමේ හා එලීමේ කොන්ත්‍රාත් ලියවිලි අනුව ව්‍යාපෘතියේ වැඩබිම් කාර්යාල නඩත්තු කිරීමේ සියළු වියදම් රු.මිලියන 34.36 කට ඇස්තමේන්තු කර ප්‍රමාණ පත්‍රයේ අයිතම 1.31 යටතේ ඇතුළත් කර තිබුණි. කෙසේ වුවද, වැඩබිම් කාර්යාලවල විදුලිය, ජලය, දුරකථන හා අනෙකුත් පහසුකම් නඩත්තු වියදම් ලෙස ප්‍රමාණ පත්‍රයේ අංක 1.22 යටතේ කොන්ත්‍රාත්කරුට රු.මිලියන 3.68 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ගොතටුව ජලාශය හා විද්‍යුත් පොම්පාගාරය (Booster Pump station) ඉදිකිරීම සඳහා මූලිකව පිළියෙල කල ප්‍රමාණපත්‍රවල නඩත්තු භාරකරු නිල නිවාසය ඉදිකිරීම හා අනෙකුත් නිල නිවාස 06 ක් නැවත ස්ථානගත කිරීම සඳහාවන කාර්යයන් ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්තුවේ පිරිවැය තීරණය කිරීමට වර්තමාන වෙළඳපොල අගය පදනම් කර අධික රේටයන් භාවිතා කිරීමට කොන්ත්‍රාත්කරුට හැකියාව ලබා දෙමින් ඉංජිනේරු ඇස්තමේන්තුවේ තාවකාලික මුදල් (Provisional sums) යටතේ පිළිවෙලින් රු.මිලියන 10 ක් හා රු.මිලියන 95 ක් මේ සඳහා වෙන්කර තිබුණි.

**3.6 මූල්‍ය පාලන ගැටළු**

-------------------------------------

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 05 දරන 2010 ජූලි 26 දිනැති චක්‍රලේඛය පරිදි ව්‍යාපෘතියේ ගණුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය යටතේ විගණනයට භාජනය කර නොතිබුණි.